**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය**

**මහජන ආරක්ෂක අමාත්‍යාංශය**

**ආගමන හා විගමන දෙපාර්තමේන්තුව**

# ලංසු ආරාධනය

# ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත ලැප්ටොප් පරිගණක 50 ක් සැපයීම, භාරදීම, ස්ථාපනය සහ නඩත්තු කිරීම සඳහා ප්‍රසම්පාදනය

## කොන්ත්‍රාත් අංකය (IFB): DIE/PRO/06/2024/11

1. ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් **ආගමන හා විගමන දෙපාර්තමේන්තුව වෙත ලැප්ටොප් පරිගණක 50 ක් සැපයීම, භාරදීම, ස්ථාපනය සහ නඩත්තු කිරීමට ප්‍රසම්පාදනය සඳහා** යෝග්‍යතා පූර්ණ සැපයුම්කරුවන්ගෙන් මුද්‍රා තැබූ ලංසු කැඳවනු ලැබේ.

2. මෙම ලංසුකරණය ජාතික තරගකාරී ලංසුකරණ ක්‍රියා පටිපාටිය යටතේ පැවැත්වේ.

3. රුපියල් අටදහක (රු.8,000/-) ක ආපසු නොගෙවන ගාස්තුවක් ගෙවීමෙන් හා ලිඛිත අයදුම්පතක් නියෝජ්‍ය පාලක (ප්‍රසම්පාදන), ප්‍රසම්පාදන අංශය, 5 වෙනි මහල, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව, "සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල වෙත ඉදිරිපත් කිරීමෙන් පසු මේ පිළිබඳව උනන්දුවක් දක්වන ලංසුකරුවන්හට ඉංග්‍රීසි භාෂාවෙන් ඇති සම්පූර්ණ ලංසු ලිපිලේඛන කට්ටලයක් 2024/04/29 දින සිට 2024/05/20 දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාල පරිච්ඡේදය තුළදී මිල දී ගත හැක. ගෙවීම් කළ යුත්තේ මුදලිනි.

4. මේ පිළිබඳව උනන්දුවක් දක්වන යෝග්‍යතා පූර්ණ ලංසුකරුවන්හට වැඩිමනත් විස්තර සතියේ වැඩ කරන දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 3.00 දක්වා කාල පරිච්ඡේදය තුළ දී 0112-101559 දුරකතන අංකය අමතා ලබාගත හැක. 3 වැනි ඡේදයේ සඳහන් ලිපිනයේ ඇති කාර්යාලයට 2024/04/29 දින සිට 2024/05/20 දින දක්වා පැමිණ හෝ දෙපාර්තමේන්තු වෙබ් අඩවිය (www.immigration.gov.lk) හරහා හෝ නොමිලේ ලංසු ලිපිලේඛන පරීක්ෂාව සිදු කළ හැක.

5. නිසි ලෙස සම්පූර්ණ කරන ලද ලංසු, 'මුල් පිටපත' (Original) හා 'අනුපිටපත' (Duplicate) ලෙස පිටපත් දෙකකින් යුතුව වෙන වෙනම කවරවල බහා එම කවර එකම කවරයක බහා මුද්‍රා තබා මෙම මුද්‍රා තැබූ කවරයේ වම්පස ඉහළ කෙළවරේ කොන්ත්‍රාත්කරුගේ නම සහ IFB අංකය සඳහන් කර පහත සඳහන් කර ඇති ලිපිනයට 2024/05/21 වැනි දින ප.ව. 2.00 ට හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ ගෙනවිත් ඒ සඳහා 3 වැනි ඡේදයේ දක්වා ඇති ලිපිනයේ තබා ඇති පෙට්ටියට බහාලීම හෝ සිදු කළ යුතුය. භාරදෙනු ලබන ලංසුව ලංසු භාරගන්නා අවසාන දින සිට දින හැත්තෑ හතක් (77 ක්) දක්වා හෝ ගැනුම්කරු විසින් නියම කරනු ලබන ඕනෑම දිගු කරන කාල පරිච්ඡේදයක් සඳහා වලංගු භාවයෙන් යුක්ත විය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු කැඳවීම අවසන් වූ වහාම පැමිණීම සඳහා කැමත්ත දක්වන ලංසුකරුවන්ගේ නියෝජිතයන් ඉදිරියේ දී ලංසු විවෘත කරනු ලැබේ.

**සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**05 වන මහල, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,**
**"සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල.**

**සභාපති,**
**දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**05 වන මහල, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව,**
**"සුහුරුපාය", ශ්‍රී සුභූතිපුර පාර, බත්තරමුල්ල.**